**පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය - 2013**

---

පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2013 මැයි 08 දින එළඹි අංක 2892 එස්ආර්අයි සහ අංක 2893 එස්ආර්අයි (එස්එෆ්) දරන ව්‍යාපෘති ගිවිසුම්වල 11 ව්‍යවස්ථාවේ 2.09 (අ) වගන්තිය සහ ප්‍රදාන අංක 0303-එස්ආර්අයි (ඊඑෆ්) සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---

පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව, විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ලංකා විදුලිබල මණ්ඩලය (CEB) ව්‍යාපෘතියේ සියළුම කොටස් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SEA) 07 වැනි කොටස ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. පිවිතුරු විදුලි බල සැපයුම වැඩිකිරීම සහ ශ්‍රී ලංකාවේ විදුලි බලය බෙදාහැරීමේ කාර්යක්ෂමතාවය හා විශ්වාසය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ.

2012 අගෝස්තු මස ව්‍යාපෘති කළමනාකරණ අත්පොත අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 200 ක් හෙවත් රු.මිලියන 25,240 ක් වන අතර එයින් රු.මිලියන 16,593 කට සමාන එජඩො මිලියන 131.5 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකග වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 සැප්තැම්බර් 30 දින ආරම්භ කරන ලද අතර 2016 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට නියමිතය. මූල්‍යායන ප්‍රභවයන් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| ප්‍රභවය | කොටස් අංකය | එජඩො මිලියන | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන |
|---|---|---|---|---|---|
| ආසියානු සංවර්ධන අරමුදල (ඒඩීඑෆ්) ණය-ලංවිම | 1 | 30.0 | | 3,786.00 | |
| ආසියානු සංවර්ධන බැංකුව - සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් (ඕසීආර්)ණය - ලංවිම | 2,3,4,5,6සහ7(i) | 100.0 | | 12,620.00 | |
| ප්‍රදාන - පිවිතුරු බලශක්ති අරමුදල * | 7 (ii) –(iv) | 1.5 | 131.5 | 189.30 | 16,595.3 |
| ශ්‍රී ලංකා රජය | | | 68.5 | | 8,644.7 |
| **මුළු ඇස්තමේන්තු පිරිවැය** | | | **200.0** | | **25,240.0** |

* ආසියානු සංවර්ධන බැංකුව විසින් පරිපාලනය කරනු ලබන පිවිතුරු බලශක්ති මූල්‍යායන හවුල් පහසුකම් යටතේ වූ විවිධ ප්‍රදාන පිවිතුරු බලශක්ති අරමුදල.
දායකයා : ඕස්ට්‍රේලියා, නෝර්වේ, ස්පාඤ්ඤය සහ ස්වීඩන් යන රටවල ආණ්ඩුවලින් ලැබී ඇත.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම්**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙලකිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂයය පථය සහ මතය සඳහා පදනම**

--------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම් ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම්වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂාකිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියෙහි මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ව්‍යාපෘතියේ අරමුදල්වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඇ) මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන පිළියෙල කර තිබුණේ ද යන බව.

(ඈ) සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

**3. මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 05 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශන සහ විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ පළමු ගිණුම් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.59,940,122 ක් විය. විස්තර පහත දැක්වේ.

| ක්‍රියාකාරකම් | 2013 වර්ෂය සඳහා වියදම |
|---|---|
| | රු. |
| මන්නාරම විදුලි සම්ප්‍රේෂණ යටිතල පහසුකම් | 11,839,172 |
| නව පොල්පිටිය විදුලි සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය | 16,853,330 |
| පාදුක්ක සහ කෑගල්ල විදුලි සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය | 14,955,233 |
| මධ්‍යම වෝල්ටීයතා ජාල බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම | 16,292,387 |
| **එකතුව** | **59,940,122** |

## 5. විගණන නිරීක්ෂණ

### 5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා විදුලි බල මණ්ඩලයෙන් ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද නිලධාරීන් ලබාගත් ණය මුදල් වලට අදාළව ඔවුන්ගෙන් අයකර ගන්නා ලද රු.1,715,526 ක් වූ ණය පොළී ආපසු ගෙවා ව්‍යාපෘති වියදමක් ලෙස සලකා තිබුණි.

(ආ) ජා ඇල සහ මන්නාරම පිහිටි කාර්යාල ගොඩනැගිලිවල එකතුව රු.1,197,600 ක් වූ බදු කුලී ව්‍යාපෘතිය විසින් 2013 අගෝස්තු 26 දින කලින් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ මාස තුනකට අදාළ රු.349,600 ක් වූ බදු කුලී ව්‍යාපෘති වියදමක් ලෙස අයනොකර සම්පූර්ණ අත්තිකාරම් මුදලම මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් ලෙස පෙන්වා තිබුණි. තවද බදු ගිවිසුම ක්‍රියාත්මක වූ දින සිට වර්ෂයකට පසුව එකී ගිවිසුම අත්සන් කර තිබුණු බව ද නිරීක්ෂණය විය.

## 6. මූල්‍ය සහ භෞතික කාර්ය සාධනය

### 6.1 අරමුදල් උපයෝජනය

ලබාගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘති මූල්‍යයනය සහ 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| අරමුදල් ප්‍රභවය | ඇස්තමේන්තුගත පිරිවැය | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ආසියානු සංවර්ධන බැංකුව | 131.5 | 16,595.3 | - |
| ශ්‍රී ලංකා රජය ලංචිම | 68.5 | 8,644.7 | 60 |
| **එකතුව** | **200.0** | **25,240.0** | **60** |

**6.2 නිශ්කාර්ය වත්කම්**

ව්‍යාපෘතියේ 6 වැනි කොටසේ (මධ්‍යම වෝල්ටීයතා ජාල බල ශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම) කාර්යාලය සඳහා කුලියට ගත් පරිශ්‍රය 2013 මාර්තු මස සිට අපේක්ෂිත කාර්යය සඳහා උපයෝගී කරගෙන නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය. මේ සඳහා 2014 අගෝස්තු දක්වා රු.540,000 ක කුලී මුදලක් ගෙවා තිබුණි.

**6.3 භෞතික ප්‍රගතිය**

යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ මූලික වැඩ හැරුණුවිට ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර තිබුණි.